රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Provincial Councils and Local Government**

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | **Combined Services Division**
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | *Independence Square, Colombo 07, Sri Lanka*

දුරකතනය / தொலைபேசி: 011- 2694560 / Telephone
ෆැක්ස් / தொலைநகல்: 011- 2692254 / Fax
ඊ- මේල් / மின்னஞ்சல்: dgcs@pubad.gov.lk / E-mail
වෙබ් අඩවිය / இணையத்தளம்: www.pubad.gov.lk / Web Site

මගේ අංකය / எனது இல / My No: CS/DOS/Policy/04
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி: / Date: 2025.02.13

අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**2022.01.03 හා 2022.04.01 දිනැතිව බඳවාගනු ලැබූ සංවර්ධන නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා සහන ලබා දීම - සංවර්ධන නිලධාරී සේවය**

උක්ත කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2023 සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/APP/13/4/33/2023 හා 2024.08.08 දිනැති ලිපිය හා බැඳේ.

02. එමඟින් දන්වා ඇති පරිදි 2022.01.03, 2022.04.01 දිනැතිව බඳවාගන්නා ලද සංවර්ධන නිලධාරීන් පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වීමට නියමිත දිනය 2024.06.30 දිනට පසුව යෙදී ඇති බැවින් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2023 හි විධිවිධාන පරිදි එම නිලධාරීන්ට අනුගාමී විභාග අවස්ථා 03ක් ඇතුළත III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කළ හැකිය. එම නිසා 2022 වර්ෂයේදී සංවර්ධන නිලධාරී සේවයට බඳවා ගන්නා ලද නිලධාරීන් පත්වීම් දින සිට එළඹෙන පළමු අනුගාමී විභාග අවස්ථා 03ක් (ඉදිරියේදී පවත්වනු ලබන විභාග අවස්ථාද සමඟ) ඇතුළත 1 වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වන්නේ නම්, එම නිලධාරීන්ට 1 වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම සඳහා නියමිත සහන කාලය ලබා දී සංවර්ධන නිලධාරී සේවයේ පත්වීම ස්ථිර කිරීමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි.

03. කෙසේ වුවද පරිවාස කාලය තුළ පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් නොවූ නිලධාරීන්ට එම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කරන තෙක් තුන්වන වැටුප් වර්ධකය ගෙවීමට හැකියාවක් නොමැති අතර, එතෙක් තුන්වන වැටුප් වර්ධකය නතර කිරීමට කටයුතු කළ යුතුය. එසේ වුවද අනුයාත විභාග අවස්ථා 03ක් ඇතුළත III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කළහොත් නතර කරන ලද වැටුප් වර්ධක ගෙවීමට කටයුතු කළ හැකි බව ද කාරුණිකව දන්වා සිටිමි. එම නිසා අනුගාමී විභාග අවස්ථා 03ක් ඇතුළත 1 වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වන නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් සහන ඉල්ලීම් මා වෙත යොමු කිරීමෙන් වළකින ලෙස වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

එන්.යූ.නිෂාන් මෙන්ඩිස්
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්